චක්‍රලේඛ අංක 03/2016

මගේ අංකය: NP/10/03/COM/CIR/2016

සමූපකාර සේවක කොමිෂන් සභාව,

උතුරු පළාත් සභාව,

2016.07.15

උතුරු පළාතේ සියළුම සමූපකාර සමිතිවල සහ

සංගම්වල සභාපතිවරුන් වෙත.

**ඉහල තනතුරක සේවකයෙකු තම රාකාරිය සමග පහල තනතුරක රාජකාරිය ඉටු කිරීමට සිදුවන අවස්ථාවලදී එම වැඩ ආවරණය කිරීමේ පත්වීම් සහ ගෙවීම්**

වැඩ බැලීම් හා නියමිත රාජකාරී පිළිබඳව නිකුත්වූ චක්‍රලේඛවල මේ සඳහා විධි විධාන සලස්වා නැති හෙයින් පහළ මට්ටමේ තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා පත්වීම් ලබාදිය නොහැකි තත්වයක් උදාවී ඇති බවට සමිති විසින් පැමිණිලි කර ඇත. එබැවින් පහත සඳහන් කොන්දේසි මත සමූපකාර සේවක ආයතන සංග්‍රහයේ 1. 8 වගන්තියට අමතරව වැඩ ආවරණය කිරීම සඳහා පත්වීම් සහ වැටුප් ගෙවීම් පිළිබඳවූ විධි විධානය වහාම ක්‍රියාත්මක වනසේ ඇතුලත් කරනු ලැබේ.

01. වැඩ ආවරණය කරන තනතුර ස්ථිර තනතුරට පහල තනතුරක් විය යුතු අතර ස්ථිර තනතුරට ළඟ වන හෝ ඉන් පසු වන පහල තනතුරක් විය යුතුය.

02. කුමණ කරුණක් මත හෝ වැඩ ආවරණය කිරීමේ වැඩ කටයුතු අදාල තනතුරට උසස්වීම් ලැබීමට නියමිත පහල තනතුරේ සේවකයෙකුට අසාධාරණයක් නොවන බව තහවුරු කර ගත යුතුය.

03. වැඩ ආවරණය කිරීමේ පත්වීම සමිතියේ පවත්නා අභ්‍යන්තර පාලනය දුර්වල කිරීමක් නොවිය යුතුය.

04. තනතුරු දෙකේම වැඩ කටයුතු නිවැරදිව සතුටුදායකව ඉටුකර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කල යුතුය.

05. වැඩ ආවරණය කරන්නාවූ තනතුරේ ආරම්භක වැටපෙන් 1/4 ක් වැඩ බැලීමේ දීමනාව වශයෙන් ගෙවිය හැකිය.

ඉහත සඳහන් කරන ලද වැඩ ආවරණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලයේ පැහැදිලි තීරණය, සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්ගේ නිර්දේශය, උතුරු පළාත් සමුපකාර කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. එමෙන්ම 2015.04.29 දිනැති සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2015 හි සඳහන් කරුණුද සැලකිල්ලට ගත යුතුය.

2016.07.15 දින කොමිෂන් සභාවේ තීරණය පරිදි.

අත්සන

පී. වාගීසන්,

ලේකම්.

P.VAGESHAN
Secretary
Co-operative Employees Commission
Northern Provincial Council